# ගොවි දිනය යනු කුමක් ද?

*කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය*
*ගරු ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා විසිනි*

"මඩ සෝදා ගත් ගොවියා රජකමට ද සුදුසුය" යන්න අළුත් කියමනක් නොවේ. නමුත් මඩ තැවරුණු පමණින්ම ඔහු පිළිකුල් කළ යුතු ද?

අප දැන් එළඹ ඇත්තේ එවැනි යුගයක අවසානය කරාය. මඩ සෝදා ගත් ගොවියා ගොවියෙකු නොවේ. රටට "බත" සැපයීමට අනන්ත අප්‍රමාණ වෙහෙසක් දරා මහ පොළොව හා ගැටී, ඒ මහ පොළොව මතම මිහිදන් වී, එයටම පොහොරක් වී යන ගොවියාගේ ගතෙහි නිතැතින්ම මඩ තැවරී ඇත. හෙතෙම ගොවියකු වන්නේ ඒ නිසාමය.

ජාතියක කුසගිනි නිවාලීමේ මහඟු කර්තව්‍යයක නියැලෙන පනස් ලක්ෂයකට ආසන්න වන මෙරට ගොවි ජනතාවට රජවරුන් මෙන් ජීවත් වීමේ අයිතිය ඔවුන්ගෙන්ම යැපෙන්නන් විසින් තහවුරු කළ යුතුව ඇත. මේ අදහසෙහි තරයේ එල්බ සිටින වර්තමාන රජය ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයකින් ගොවියා සුරක්ෂිත කිරීමට ගත් උත්සාහය පැසසිය යුත්තකි. එසේම ඉන් නොනැවතී "ගොවි දිනයක්" ප්‍රකාශයට පත් කිරීම ලක්ෂ සංඛ්‍යාත ගොවීන් ලත් මහඟු ජයග්‍රහණයක් වන්නේ ය.

ගොවීන් උදෙසාම උපන් භක්ත්‍යාදරයෙන් යුතුව ලෝකයේ මුල් වරට ගොවි දිනයක් ප්‍රකාශයට පත් කරමින් ගොවි දිනයෙහි සැබෑ නිර්මාතෘවරයා වූ ද, වර්තමාන කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යවරයා වූ ද, ගරු ආර්. එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමා "ගොවි ජනතාව" වෙනුවෙන් අප හමු වූයෙමු.

*ප්‍රශ්නය :*

ගරු ඇමතිතුමනි, මේ දිනවල ජන මාධ්‍යය මගින් ප්‍රචාරය වන ප්‍රධාන පුවතක් තමයි ගොවි දිනය. මේ ගොවි දිනය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? එහි ඇති විශේෂත්වයන් කවරේ ද?

*පිළිතුර :*

ඔය ගොල්ලො දන්නවා බොහොම මෑත කාලයේ දී මේ ලෝකෙ තිබුණා වහල් යුගයක් කියල එකක්. වහල් යුගයක් කියන්නෙ කම්කරුවන්ගෙන් තළල, පෙළල, මරල වැඩ ගන්න යුගයක්, ක්‍රමයක් ඒ දවස් වල තිබුණා, වහල් වෙළඳාම කියල එකකුත්. මිනිසුන්ට තමන්ගේ වැඩ කරවා ගන්ට ඕනෙ කරන කම්කරුවන් සල්ලි වලට ගන්නවා. ඒ සඳහා වහල්ලු (කම්කරුවන්) විකුණන වෙළඳ පොළවල් තිබුණා. ලෝක ශිෂ්ටාචාරය වෙනස් වන කොට ඒ වහල් යුගයත් වහල් ක්‍රමයත් වෙනස් වෙිගන ආවයින් පස්සෙ මේ කම්කරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමට කම්කරු දිනයක් කියලා එකක් උවමනා උනා. ඒ දිනය ඉන් පස්සේ ප්‍රකාශයට පත් කලා. ප්‍රකාශයට පත් උනාම එය ලෝකය පුරා ව්‍යාප්ත වෙන්න සෑහෙන කාලයක් ගත වුනා. නමුත් අද සාමාන්‍ය කම්කරුවෙකුට තමන්ට රැකියාවක් ලැබුන දවසෙ ඉඳලා ලැබිය යුතු වන අයිතිවාසිකම්, හිමිකම් රාශියක් නීති ගත වෙලා තියෙනවා. මේවා සමහර ඒවා සම්ප්‍රදායෙනුත් තවත් සමහරක් නීතිය මගිනුත් නීති ගත වෙලයි තියෙන්නේ.

ඒ කම්කරුවන්ට ලැබෙන තැන එහෙමම තියෙද්දී අපි ලංකාවේ හැමදාම කීව කථාවක් තමයි ගොවියා මෙච්චර දෙයක් කරද්දිත් ඒ අයට නියමිත තැනක් ලැබිලා නැහැයි කියන එක. ඒ කියන්නෙ ගොවිතැන් කරන්න ගියාම රෑ දහවල් කියල දෙකක් නැතිවයි වැඩ කරන්නේ. හරියටම කාලයට ඒ ගොවිතැන් කර ගන්න ඕනෙ. හරියට වෙලාවට පොහොර දමන්ට ඕනෙ. වතුර ටික බඳින්ට ඕනෙ. වල් පැලෑටි විනාශ කරන්ට ඕනෙ. ඒ එක්කම එල නෙලා ගන්න ඕනෙ හරියට කාලයට. කාලයත් එක්ක විශාල අරගලයකුයි ගොවියා කරන්නේ. අපේ මේ ලංකාවේ කාලයක් තිස්සේ තිබුණු අදෝනාවක් තමයි ගොවියා මේ තරම්ම දුරට නිෂ්පාදනය කරලා දෙද්දී ගොවියා ගැන සැලකිල්ලක් නැහැ ; ඒ අය හඳුනාගෙන නැහැ; ඒ අයට සමාජයේ නිසි තැනක් නැහැ'යි කියන එක. අපිට ඒක සමහර වෙලාවට පේන්ට තියෙනවා. ගොවියෙක් යම් ආයතනයකට ගියාම, ගොවියා කියන්නේ නිතරම දාඩිය හෙලන පුද්ගලයෙක්. ඉතින් සමහර අය ගොවියාගේ දහඩිය ගඳ'යි කියලා හුභක් අප්‍රසන්න තාවයක් පළ කරපු අවස්ථා ගැන අපි අහල තියෙනවා.

මෙහෙම තිබුන යුගයකයි ඔය "හරිත විප්ලවය" කියන එක ආරම්භ වුනේ. මෙය 1960 විතර කාලෙදියි ආරම්භ වුනේ. ඒ වන විට ලෝකෙට විශාල වශයෙන් ආහාර වගී නිෂ්පාදනය කරන්ට අවශ්‍ය වෙලා තිබුණා. ඒ නිසා තමයි මේ විප්ලවය ආරම්භ කළේ. ඊට පස්සෙ එම විප්ලවය සාර්ථකව කර ගෙන ගියා. අපේ රටෙත් මේ විප්ලවය ආරම්භ වුනා. ඒකෙන් සෑහෙන දුරට "ගොවියා" කියන පුද්ගලයා ඉදිරියට ආවා. නමුත් අපිට මේ ශත වර්ෂය අවසන් වෙන කොටත්, මේ අන්තිම දශකයෙහි අපි ඉන්නෙ. අපිට නිතර දෙවේලේ අහන්ට ලැබෙන කතන්දරයක් තමයි, ගොවීන්ට මේ තාක් කල් නියමිත තැනක් ලැබිලා නැහැ. ඒ අයට සලකන්නේ නැහැ. නොසලකා හරින ලද පිරිසක්. ඒ අය කරන වැඩේ ඒ තරම්ම ඉහළින් සලකන්නෙ නෑ. ඒ ගැන අවබෝධයකුත් නැහැ කියන එක. නමුත් අපි කන මේ කෑම වර්ග සෑම දෙයක්ම පාහේ නිෂ්පාදනය කරන්නේ ඒ ගොවියා විසින් බව, ගොවිපොළෙන් බව, යම් යම් හේතුන් මත ආහාර අගය කරද්දීවත් හිතන්නේ නැහැ.

අපිට අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කරන්ට නම්, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කරන්ට නම් ගොවියා ඉදිරියට ගන්ට ඕනෙ කියලා මගේ ලොකු විශ්වාසයක් ඇති වෙලා තිබුණා. ඒ වගේම ඒක එච්චර අමාරු වැඩක් නොවන බවත් මම දන්නවා. ඒ නිසා මම ඒකක් නීති ගත කෙරුවා, මේ ගොවීන් සංවිධානය කරන්ට. සංවිධානය වෙන්ට ඕනෙ කියන එක. ගොවි සංවිධාන ඇති කිරීම නීති ගත කරලා දැන් ක්‍රියාත්මක වෙනවා. නමුත් තවම මම බලාපොරොත්තු වුන තත්ත්වයට සංවිධානය වෙලා ඉවර නැහැ. දැනට අවසන් වෙලා තියෙන්නෙ ගම් මට්ටමින් සංවිධානය වීම පමණයි. ඉන් පස්සෙ මම බලාපොරොත්තු වෙනවා ප්‍රාදේශීය මට්ටමට, දිස්ත්‍රික්ක මට්ටමට, සමස්ථ ලංකා මට්ටමට ගොවීන් සංවිධානය කරන්ට. ඒ සඳහා ටික කාලයක් ගත වෙයි. දැනට මට පෙනී ගොස් තියෙනවා මේ අලුත් නීති රීති යටතේ ගොවි සංවිධාන ඇති කරන විට පළමුවෙනි තුන් මාසෙ තුලදී ගොවි සංවිධාන 7,500ක් මේ රටේ බිහි වෙලා තියෙනවා. ඉතින් ඒකෙන් පේනවා ගොවියා කොයි තරම් උවමනාවකින් හිටිය ද කියලා මේ ගැන.

ඒ හැරුණහම අපි ඇති කරපු ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පළමුවෙනි කණ්ඩායමට විශ්‍රාම වැටුප් ප්‍රදානය කරන්ට මට අවස්ථාව ලැබුණා. ඒකෙන් ගොවියා

තුළ විශ්වාසයක් ඇති වුනා. මොකද මේ රටේ බොහෝ දෙනෙක් මේ විශ්‍රාම වැටුප් ගෙවනවයි කියන එක ගැන විශ්වාසයක් නැතුවයි හිටියෙ. නමුත් පළමුවෙනි වැටුප් වාරිකය දෙන්ට පටන් ගත්තායින් පස්සෙ දැන් ගොවියා මාසෙන් මාසෙ එයාට හිමි විශ්‍රාම වැටුප ගන්නවා. දැන් ඒක නිසා විශ්වාසය තහවුරු වුනා. ගොවීන්ට විශ්වාසයක් ඇති වෙලාතියෙනවා මේ විශ්‍රාම වැටුප ලැබෙනවයි කියන එක ගැන.

තවදුරටත් මේ අය අතරේ විශ්වාසයක් ඇති කරන්ට, ඒ වගේම මේ අය ඉදිරියට ගන්ට, ධෛර්යමත් කරන්ට, අර සමාජයෙන් කොන් උන'යි කියන තත්ත්වයෙන් බැහැර කරන්ට තමයි අර ගොවි විශ්‍රාම වැටුප් දෙන දිනයේදී මම කල්පනා කලේ, ගොවි දිනයක් පවත්වන්නට. මම ඒක යෝජනා කළා. රජය, කැබිනට් මණ්ඩලය කිසිම පැකිලීමකින් තොරව ඒකට අනුමැතිය දුන්නා. දැන් අපි ඔක්තෝබර් 20 කියන දිනය මේ රටේ ගොවි දිනය විදියට නම් කරලා තියෙනවා.

ප්‍රශ්නය :

ඔබතුමා ප්‍රකාශ කළා ඔක්තෝබර් මාසෙ විසිවෙනි දින ගොවි දිනය වශයෙන් නම් කරලා තියෙන බව. එම දිනයම ඒ සඳහා යොදා ගැනීමට විශේෂිත වූ හේතූන් මොනවාද?

*පිළිතුර :*

අපේ රටේ තියෙනවා යල මහ කියලා කන්න දෙකක්. මේ රටේ ගොවීන් වැඩි නිෂ්පාදනයක් කරන්නෙ මේ මහ කන්නයට. වර්ෂාපතනය හොඳට ලැබෙන්නෙත් මේ මහ කන්නයට. ඒ නිසා මහ කන්නය ආරම්භයේදී ගොවි දිනය ගොවියාට ලබා දුනහොත් ඉන් ඉදිරි කාලයේදී ප්‍රයෝජන රාශියක් ගන්ට පුළුවන් වෙයි කියලා මම හිතුවා. මොකද ගොවියා ගොවිතැන් කිරීමට ඉදිරිපත් වෙන, සූදානම් වෙන කාලය තමාගේ දිනය කියලා ගත්තහම ඒකෙන් කරන්ට පුළුවන් සංවිධානාත්මකව තමන්ගෙ අමුණු එළිපෙහෙලි කරගන්න එක, අමුණෙ යම් යම් අඩුපාඩු තියෙනවා නම් ලැලි ආදී දේවල් යොදා ඒවා සකස් කර ගන්න එක ඊළඟට ඇළවල් ශුද්ධ පවිත්‍ර කරන එක වගේ වැඩ කටයුතු රාශියක් ගොවීන් දැනටමත් කරනවා. කොහොමටත් ඒක කරන්න ඕනේ ඒ ගොල්ලො. ඒ නිසා මහ කන්නය ආරම්භයේදීම වූ මෙම දිනය "ගොවි දිනය" වශයෙන් නම් කිරීම වැදගත් වෙනවා. කොහොම උනත් මහ කන්නය ආරම්භ වෙන්නෙ සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස වල හින්ද මේ දිනය ගන්ට වෙන්නෙ ඒ මාස දෙක තුළින්.

මම කල්පනා කළා ඒ වගේ කාලයකින් මේ සඳහා හොඳ දිනය මොකක්ද කියලා නොයෙක් නොයෙක් හේතූන් මත දින කිහිපයක් මට ලැබුණා. ඒ අනුව ලැබුන එක දිනයක් තමයි ඔක්තෝබර් 20.

මම මේ දිනය ගරු ජනාධිපති තුමාට දැන්නුවයින් පස්සේ එතුමා මෙය බොහොම ඉහළින් පිළිගෙන සිය අනුමැතිය ලබා දුන්නා. ගරු ජනාධිපතිතුමා තමයි මේකෙ රහස කියා දුන්නෙ. ඔක්තෝබර් 20 කියන්නේ නිදහස් ලංකාවෙ පළමුවෙනි අග්‍රාමාත්‍ය මහාමාත්‍ය ගරු ඩී. එස්. සේනානායක මැතිතුමාගේ උපන් දිනය. ඉතින් එතුමා ඇත්ත වශයෙන්ම අගමැති වෙන්ටත් ඉස්සර වෙලා ඉඳලා රාජ්‍ය මන්ත්‍රන සභාව කාලෙ ඉඳලම කෘෂිකර්ම කටයුතු පිළිබඳව තමයි මූලිකත්වයක් දුන්නේ. මේ රට දියුණු කරන්ට පුළුවන් ගොවිතැන් කටයුතු දියුණු කිරීමෙන් පමණයි කියන විශ්වාසෙ එතුමාට තිබුණා. ඒ වගේම එතුමා පුදුමාකාර වැඩ ටිකක් කරලා තියෙනවා. ඒ නිසා එතුමාට උපහාරයක් වශයෙන් අපි හිතුවා මේදිනය හොඳයි කියලා. මම හිතන්නෙ මුළු ලංකාවම කිසිම බේදයකින් තොරව ඒ දිනය පිළි ගත්ත. මේ අනුව මේ තීරණය ගැනීමට පාදක වූ හේතු, එකක් මහ කන්නය ආරම්භ වීම, අනෙක නිදහස් ලංකාවේ පිරිහීමට පත් වී තිබුණු ගොවිතැනට ජීවය ලබා දුන් ප්‍රථම අග්‍රාමාත්‍යවරයාගේ උපන් දිනය වීම.

ප්‍රශ්නය :

මේ උත්සවය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රදේශය තෝරා ගැනීමට විශේෂ වූ කරුණු කවරේ ද ?

*පිළිතුර :*

එහෙම විශේෂයක් නැහැ. අනික ගොවි දිනය සැමරීම සඳහා පොළොන්නරුව තෝරා ගත්තා' යයි කියන එක වැරදි අදහසක්. "ගොවි දිනය" කියන එක මුළු ලංකාව පුරාම සෑම තැනකම සැමරෙනවා. මම කල්පනා කරන්නෙ නැහැ ගොවියො දාහක්, දහදාහක්, ලක්ෂයක් හෝ දශ ලක්ෂයක් එක තැනකට ගෙනල්ලා ගොවි දිනය සමරන්ට. මම කියලා තියෙන්නේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අඩුම වශයෙන් එක උත්සවයක්වත් පවත්වන්ට කියලා. මේ රටේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන තියෙනවා 538 ක්. ඒවායින් දැනට යම් යම් කරදර තියෙන උතුරු නැගෙනහිර ප්‍රදේශ හැරුණු විට ඉතුරු ඒවායෙහි සෑම තැනම ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් මේ ගොවි දිනය සැමරිය යුතු වෙනවා. මම කීව වගේ ගම් මට්ටමින්, යාය මට්ටමින් ඇතිවුන ගොවි සංවිධාන දැන් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ඒකරාශී වෙලා තියෙනවා. ඒ නිසා ඒ යටතේ සංවිධාන කටයුතු කරන්ට පුළුවන්. රටේ එක තැනක මේ උත්සවය පවත්වන්ට නොවෙයි මගේ බලාපොරොත්තුව. ගොවීන් රට පුරා දීපව්‍යාප්තව විසිරිලයි ඉන්නෙ. ඒ හැම තැනකම විසිරිලා ඉන්න සෑම දෙනාටම හැඟීමක් එනවා අද අපේ දවස. අපේ දවස කියන්නෙ ඒ දිනය විතරක් නොවෙයි. අපේ සිරිතක් තියෙනවා මේ රටේ ගොවිතැන් කිරීමේදී මුලින්ම නැකැත් බලනවයි කියල එකක්, ආගමික වතාවත්වල යෙදෙනවයි කියල එකක්, බාරහාර වෙනවයි කියල එකක්. මේවායෙ පිහිට ලැබෙනවායි කියල විශ්වාසයක් තියෙනවා. ඒක නිසා අපි සතියක් තුළ ගොවියා සකස් කරනවා මේ වැඩේට. මුල්ම දිනයෙ ඒ අයගේ ආගමික වතාවත්වල බාරහාර වෙන ඒවායේ යෙදෙනවා. ඒවා මේ රටට අදාල සංස්කෘතිකමය වශයෙන් වැදගත්කමක් තියෙන දේවල්. ඒ වගේම අපේ ගොවියා ඒ පිළිබඳව දැඩි විශ්වාසයකින් පසු වෙනවා. ආවාට ගියාට ගොවිතැන් කරන්නෙ නැහැ. මොකද ඒ අය දන්නවා හොඳ නැකතකින් පටන් ගත්තොත් ඒ අයට හොඳ ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන් බව. මම හිතන්නේ ගොවියා විතරක් නොවෙයි අපේ ඉතාමත් දක්ෂ, ඒ වගේම උගත් අය උනත් යම් දෙයක් ආරම්භ කරන කොට හොඳ දවසක්, වෙලාවක්, නැකතක් බලනවා. මේක මේ මහ පොළවත් එක්ක කරන සටනක්. අපිට මෙහිදී වෙලාවට ජලය ලැබෙන්න ඕනෙ. වැස්ස ලැබෙන්නට ඕනෙ. ඒ වගේම අස්වැන්න නෙලන කාලෙට වැස්ස නැති වෙන්නත් ඕනෙ. ඒවා සිද්ධ වෙන්නෙ ස්වභාව ධර්මයත් එක්ක. ඉතින් ස්වභාව ධර්මයේ පිහිට අපිට ලබාගන්ට නම් අපි මේ වගේ දේවල් වලින් යම් ආශ්වාදයක් බලාපොරොත්තු වෙන්ට ඕනෙ. ඒ නිසා අපි ගොවීන්ට කියනවා ඒ දිනයේදී ආගමික වතාවත්වල යෙදෙන්ට කියලා, භාරහාර වෙන්ට කියලා.

ඊළඟට අපි දවස් දෙකක් වෙන් කරලා තියෙනවා ඇළවේලි, අමුණු, වැව් ඔක්කොම ශුද්ධ පවිත්‍ර කරලා සූදනම් වෙන්ට. දවස් දෙකක් ශ්‍රමදාන මට්ටමිනුයි මේක කෙරෙන්නේ තව දවසක් දීලා තියෙනවා අපේ දිනය මෙනෙහි කරන්ට අඩුම වශයෙන් එක පැළයක් වත් සිටවන්න කියලා. මම ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මේ රටේ විසි ලක්ෂයක් ගොවීන් ඉන්නවා. ගෙවතු වගා කරන අය හැරුණු විට. ඒ විසි ලක්ෂයෙන් අඩු ගානේ භාගයක්වත් පැළය බැගින් සිටෙව්වොත් පැළ ලක්ෂ දහයක් අවුරුද්දකට තමන්ගේ භූමියෙ සිටවෙනවා. ඒ නිසා පැලයක් සිටුවා ගන්ට ඕනෙ. ඊළඟට සාකච්ඡා කරන ඒවා, සම්මන්ත්‍රණ පවත්වන ඒවා, දේශන පවත්වන ඒවා, ඒ කන්නෙ ගොවිතැන් සඳහා අවශ්‍ය, උපදෙස් එහෙම ලබා ගන්න ඒවා. මේවාට අපි සම්පූර්ණයෙන්ම දවසක් වෙන් කරලා තියෙනවා. පාඨශාලා ශිෂ්‍යයොත්, ගොවීනුත් එකතුකරගෙනයි මේ ඔක්කොම කරන්නෙ. වෙන වෙනම කරන්ටත් පුළුවන්. එකට කරන්ටත් පුළුවන්. මේකට පාඨශාලාවල ඉඩකඩ ගන්න පුළුවන්. අනික් එක අපේ දැන් අළුත් වැඩපිළිවෙලක්

තියෙනවා කෘෂිකර්ම අමාත්‍යාංශයයි, ඉඩම් අමාත්‍යාංශයයි, පාරිසරික අමාත්‍යාංශයයි අධ්‍යාපන අමාත්‍යාංශයයි යන අමාත්‍යාංශ හතරම එකතු වෙලා, දීපව්‍යාප්ත වැඩ පිළිවෙලක් ගෙන යනවා. පාඨශාලා ශිෂ්‍යයින් කෘෂිකර්මාන්තයට සහ පැළ සිටුවීමේ ව්‍යාපාරයකට යොමු කරවන්ට. දැන් ඒක ආරම්භ කරලා තියෙනවා.

ඉතින් අපි එක දිනයක් වෙන් කරලා තියෙන්නේ ගොවීන් දැනුවත් කරන්ට. මෙන්න අළුත් පැළ වගී, බීජ වර්ග, මේවායේ මිළ ගණන් මෙහෙමයි, ලැබෙන්නේ මේ ආකාරයෙන්, මේවායේ මාස කීයකින් අස්වැන්න ලැබෙනවා ද ? ඒ වගේ දේවල්. ඊළඟට ගොවීන් දැනුවත් කරන්ට පුළුවන් අපිට මහ කන්නයේදී මේ කාලෙටයි වතුර ලැබෙන්නෙ. වතුර ලැබුණාම මේ කාලෙට තමයි අපි මඩවන්න ඕනෙ. හාන්න ඕනෙ.පැළ සිටුවන්ට ඕනෙ. ඒ ඔක්කොම විස්තර ටික සාකච්ඡා කර ගන්නවා. ඊළඟට මම බලාපොරොත්තු වෙනවා එතැනින් විතරක් නොවෙයි, ඊළඟට ඉදිරි කන්න වලදී කන්නේ විතරක් නොවෙයි මුළු අවුරුද්ද තුළම ඊළඟ අවුරුද්දෙ දිනය එනතෙක් අපි යල් කන්නේ වතුර අඩුවුනොත් මොනවාද මිරිස් වවනවාද, එළවළු වවනවා ද ආදී වශයෙන් ඒ ඔක්කොම සැලසුම් කරගන්ට. මම හිතන්නෙ එහිදී සාකච්ඡා කරන දේවල් සියල්ලම සිදු නොවුනත් ගොවීන් දැනුවත් වීමක් සිද්ධ වෙනවා. ඒ තුළින් ගොවියා අවුරුද්දක් ඉස්සරහට සිතන්ට පුරුදු වෙනවා.

තව දිනයක් අපි දීලා තියෙනවා සෑම අවුරුද්දකම ඔක්තෝබර් මාසේ 19 වෙනිදට. එදට පිරිතක් කියන්න ඕනේ සෑම තැනකම. ඒ කියන්නේ බෞද්ධයෝ ඉන්න තැන්වල. අනික් තැන්වල ඒ අයගේ ආගමික කටයුතු වල යෙදෙනවා. මම කියලා තියෙන සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම පිරිතක් කියන්න කියලා. පිරිතක් කියලා ඉවරවෙලා පසුවෙනිදා, විසි වෙනිදා උදේ දානයක් දීලා ඒ කටයුතු ඉවර කරන්න කියලා. එතකොට දැන් විසි වෙනිදා අපේ දිනය ; ඒ කියන්නේ ගොවීන්ගේ දිනය. එදාට ඉස්සරලාම ආරම්භ කරනවා සී සෑම. අපි සාමාන්‍යයෙන් කියනවා මෙයට "වප් මඟුල" කියලා. සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම මේ "වප් මඟුල" ආරම්භ කරනවා. ඊට පස්සේ උත්සවයක් පවත්වලා, රැස්වීමක් පවත්වලා, මේ දිනය වෙනුවෙන් ගොවීන් කථා කරලා, ගම්වල නායකයො කථා කරලා, දේශපාලන නායකත්වය කථා කරලා, මේ කථාවලදී එන්ට එන්ටම මේ අවුරුද්දේ කථාවලට වඩා ලබන අවුරුද්දේ කථා වලදී වෙනස්කම් ඇති වෙනවා. අපිට මේ මේ දුෂ්කරතා තියෙනවා කියලා කියයි, නැත්නම් මෙන්න අපි මෙතෙක් ආපු ගමන ; අපි සන්තෝෂ වෙනවා මේ ගමන ගැන ; අපිට ඉදිරි ගමන යන්ට තියෙනවා, මේ ආකාරයට. එහෙම කියලා කථා පවත්වයි. කථා පවත්වලා උත්සවය අවසන් කරනවා.

මගෙන් අහපු ප්‍රශ්නය පොළොන්නරුව ගැන. මේ රටේ සෑම තැනකම උත්සව පවත්වනවා.මේක ජාතික උත්සවයක් හැටියට රජය පිළිඅරන් තියෙනවා. අපි ජාතික උත්සවයක් වශයෙන් රටේ යම් තැනක ප්‍රධාන උත්සවයක් පවත්වනවා. මම සිතාගෙන ඉන්නේ අවුරුද්දකට එක දිස්ත්‍රික්කයක බැගින් මේ ජාතික උත්සවය පවත්වන්ට. මුල්ම අවස්ථාවේ මම පොළොන්නරුව තෝරා ගත්තේ අපේ ඩී. එස්. සේනානායක මැතිතුමාගේ උපන් දිනය වෙනුවෙන් පවත්වන දිනය. එතුමාගේ ඉතාමත් ලැදි ප්‍රදේශයක් තමයි ඔය පොළොන්නරුව ප්‍රදේශය. ඒ වගේම එතුමාගෙන් වැඩි සේවයක් සිදු වුන ප්‍රදේශයක්. ඒ නිසයි මම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රදේශය මේ සඳහා තෝරා ගත්තේ. හිඟුරක්ගොඩ තියෙන උත්සවය ජාතික උත්සවයක් හැටියට අපි 14 වෙනිදා ආරම්භ කරනවා. එය 14 වෙනිදා ආරම්භ කරන්නේ විශාල කෘෂිකර්මාන්ත ප්‍රදර්ශනයකින්. කෘෂිකර්මාන්තයේ දැන් තියෙන තත්ත්වය ; මෙතෙක් කල් ලබා ගෙන තියෙන තත්ත්වය; කොහොමද දියුණු උනේ ; ඊළඟට තාක්ෂණය මොකක් ද ? අපේ නව තාක්ෂණය, පරීක්ෂණ පවත්වන්නේ මොන ආකාරයෙන් ද ? ඒ ඔක්කොම තියෙන ප්‍රදර්ශනයක් ඊළඟට අපි ළඟ දැනට තියෙන වී වර්ග, වැඩි දියුණු කරපු සත්ත්ව වර්ග, ඊළඟට ඒවාට ඒ ගොවිතැන් කිරීම සඳහා උවමනා කරන ආම්පන්න මොනවා ද ? උදළු ආදී දේවල්, ඊළඟට ට්‍රැක්ටර්, නඟුල්, බෙහෙත් වර්ග, කෘෂි රසායන වර්ග, පොහොර වර්ග ආදී සියල්ල අඩංගු කෘෂි ප්‍රදර්ශනයක්. අපි 14 වෙනිදා ඉඳලා සතියක් පුරාම මේ ප්‍රර්ශනය පවත්වනවා. 20 වෙනිදා තමයි මේ ප්‍රදර්ශනයේ අන්තිම දිනය. එදාට විශේෂ උත්සවයක් පවත්වනවා. අර ආරම්භක උත්සවය සඳහා මේ සැරේ ගරු අගමැති තුමා එනවා. ඊළඟ දවස් පහේ දී විශේෂ අමුත්තන් වශයෙන් රජයේ කැබිනට් ඇමතිවරු, පළාත් සභාවල ඉන්න ආණ්ඩුකාරවරු සහ මහ ඇමතිවරු සහභාගි වෙනවා.

ගොවීන් වෙනුවෙන් තමයි අපි මේ උත්සවය පවත්වන්නේ. අපි දවස් හතට ගොවි පෙරහරවල් හතක් පවත්වනවා. මේක පෙළපාලියක් නොවෙයි. මේක ගොවි පෙරහැරක්. පවත්වන්නේ ගොවීන්මයි. ගොවීන්ට අපි හඳුන්වලා දීලා තියෙනවා ගොවි දිනයට වෙනම කොඩියක්, ගොවි සංවිධාන වලට වෙනම කොඩියක්. ඒ ඔක්කොම මේ සැරේ අරන් යනවා. ඉන් පස්සේ ඒවා දියුණු කරලා අරන් යයි. ඒවා යටතේ තමයි සංවිධානය වෙන්නේ.

ප්‍රදර්ශනයේ අන්තිම දවස තමයි ගොවි දිනය. එදාට ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වන්නේ ගරු ජනාධිපතිතුමා. වප් මඟුල් උත්සවය තියෙන්නේ එදාට. මැති ඇමතිවරුත් ඔක්කොම එයට සහභාගි වෙනවා. වප් මඟුල් උස්සවයෙන් පස්සේ හවස තියෙනවා ජන රැළිය. එහිදී ගරු ජනාධිපතිතුමා ගොවීන් අමතනවා. ඒ අමතලා උත්සවය වෙනුවෙන් තියෙන තරඟ වලට තෑගිබෝග දීලා අවසන් කරනවා. ඒ තමයි ජාතික උත්සවය. ඒකයි මම කීවේ වරදවා තේරුම් ගන්ට එපා කියලා, මේක එක උත්සවයක් නොවෙයි. උත්සව රාශියකින් සෑදී ඇති අතර එක් දිස්ත්‍රික්කයක ප්‍රධාන උත්සවයක් වශයෙන් එකක් පවත්වනවා.

*ප්‍රශ්නය :*

ඇමති තුමනි, මෙරට ගොවීන්ගෙන් වැඩි පිරිසක් තවමත් දුප්පතුන්. ඒ අයට මුදල් හිඟයි. මේ වගේ උත්සව පැවැත්වීම සඳහා අවශ්‍ය මුදල් ඒ අයට ලබා දෙන්න ඔබතුමා වැඩපිළිවෙලක් සකස් කර තිබෙනවා ද ?

*පිළිතුර :*

ඔව්. මම ඒ ගැන හිතුවා. මම මේ දිනයේම ඇති කරනවා ගොවි දිනය සැමරීමේ අරමුදලක්. එන්ට එන්ටම ගොවීන් පුහුණු කරනවා මේ දිනය සැමරීමට. මේක ඒගොල්ලන් විසින්ම කරන්ට ඕනෙ. මුදල් නැති නිසා තමයි මම අරමුදලක් ඇති කරලා දෙන්නේ. මම හිතනවා ටික කලක් යන කොට ගොවීන්ම මේ වැඩේ කරන්න සූදානම් වෙයි. මම කීවනේ මේ සැරේ ලංකාවෙ සෑම තැනම ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් උත්සව පවත්වනවා කියලා. ඒකත් දැනට කරගෙන යන්නේ නිලධාරීන් හා ගොවීන් දෙපිරිසම එකතු වෙලා. කාලයක් යනකොට මේක සම්පූර්ණයෙන්ම බාර ගනීවි, ගොවියො.

අනිත් එක අපි මේක දිගටම කරගෙන යන කොට, ගොවි දිනය පවත්වනකොට මේ අවුරුද්දෙ තියෙන ප්‍රදර්ශනයට වඩා අළුත් දේවල් අඩංගු ප්‍රදර්ශනයක් ඊළඟ අවුරුද්දේ පවත්වන්ට පුළුවන් වෙයි. අළුත් දේවල් රාශියක් ඒ තුළින් ගොවීන්ට හඳුන්වලා දෙන්ට පුළුවන් වෙයි. රටේ දියුණුවක් ඇති වන්නේ එතකොටයි. එහෙම නැතිව මේ ප්‍රදර්ශනයම ලබන අවුරුද්දේ කොපි කරලා හරියන්නේ නැහැ. මේ අවුරුද්ද තුළ දියුණු කරපු තාක්ෂණය මොකක් ද ? අළුතින් හඳුනා ගත්තේ මොනවා ද? වැඩි අස්වැන්නක්

ලබන ක්‍රමය මොකක් ද? කියන එක ගොවි ජනතාවට පැහැදිළි කිරීම තමයි කෘෂි ප්‍රදර්ශනයක් තියන්න මූලික හේතුව.

මම තව ටික කාලයක් යන්ට ඉස්සර වෙලා රටට දෙන්න හදනවා, හරිත විප්ලවය පටන් ගත්තයින් පස්සේ ඇත්ත වශයෙන්ම මොනවද අපේ පර්යේෂකයො, විද්‍යාඥයෝ කරල තියෙන්නේ කියලා. ඒ අය සොයා ගත්තේ මොනවා ද? ඉදිරියට ගියේ මොන ආකාරයෙන්ද කියලා විස්තරයක් දෙන්ට කල්පනා කරනවා. දැනට මම උපදෙස් දීලා තියෙනවා එය සකස් කරන්ට කියලා. මම හිතන්නේ ඒක පොතක් වශයෙන් ප්‍රසිද්ධයට පත් කරන්න තව මාස තුනක විතර කාලයක් ගත වෙයි.

ප්‍රශ්නය :

මම හිතන්නේ ඒක බොහොමත් හොඳ දෙයක්. අපේ පර්යේෂණයන්ගේ ප්‍රතිඵල, ඒ වගේම නව සොයා ගැනීම් ආදිය ගොවි ජනතාව අතරට ප්‍රමාණවත් අයුරින් යන්නේ නැහැ. අනෙක උදාහරණයක් වශයෙන් අළුත් බීජ වර්ගයක් සොයා ගත්තයි කියා හිතමු. ඒ ගැන ලැබෙන සුළු ප්‍රචාරයක් හැරුණුවිට අවුරුදු ගනනක් යන තෙක්ම ඒ පිළිබඳව ගොවීන් දැනුවත් වීමක් සිදු වන්නේ නැහැ නේද ?

පිළිතුර :

ඒකේ දුර්වලකමක් තියෙනවා. අනික් එක අළුත් බීජ වර්ගයක් නිෂ්පාදනය කළායින් පස්සේ අවුරුදු දෙකක් විතර ගතවෙන කොට ඒ බීජ වර්ගය රට පුරා ව්‍යාප්ත කරන ක්‍රමයක් අපේ බීජ නිෂ්පාදන අංශ දියුණු කරලා තිබුනේ නැහැ. ඉතින් ඒක හැඩ ගැහෙයි මේ වැඩ පිළිවෙලින්. මම හරි වෙන කවුරුවත් හරි කියන්ට ඕන වෙන එකක් නැහැ. ගොවීන් දැන ගන්නවා, අළුත් නිෂ්පාදන ගැන. කෝ දෙන්ට කියලා ඉල්ලන කොට බීජ නිෂ්පාදන ආයතන වලට සිදුවෙයි ඒවා ලබා දෙන්ට.

ප්‍රශ්නය :

මම හිතන්නේ අපි ගොවි දිනය සම්බන්ධව ගොඩක් දුරට කථා කළා. ගොවි දිනය වෙනුවෙන් එහෙම නැතිනම් ගොවීන් වෙනුවෙන් ගරු කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් දිය හැකි පණිවුඩය කුමක් ද?

පිළිතුර :

අපි මේ ගොවි දිනය පවත්වන්නේ පළමුවෙනි වතාවටයි. ලංකාවේ විතරක් නොවෙයි මම දන්නා තරමින් ලෝකයේම. මම ඇත්ත වශයෙන්ම ආඩම්බර වෙනවා ලෝකෙම ගොවීන් වෙනුවෙන් දිනයක් සමරන්ට ශ්‍රී ලංකාවේදී ලැබුණු එක ගැනත් ඒ වේලාවේදී කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටීම ගැනත්.

අනිත් එක සාකච්ඡා වලදී ලැබුණු උපදෙස් අනුව සහ මගේ අදහස් අනුවයි ගොවි දිනය මේ ආකාරයට සංවිධානය කරලා තියෙන්නේ. ඉතින් මම බලාපොරොත්තු වන්නේ ලැබෙන ආදර්ශය අනුව ඉදිරියේදී ගොවීන්ට ගොවි දිනය ප්‍රයෝජනවත්. වන ආකාරයට මෙන්න අපිටත් දිනයක් දුන්නා. අපිටත් තැනක් තියෙනවා. අපි නිෂ්පාදනය කරන නිසා රට අපිව හඳුනා ගත්තා. රජය අපිව හඳුනා ගත්තා, කියන දැනීමක් එනතෙක් මේ ව්‍යාපාරය හොඳින් කරගෙන යන්ට ඕනෙ. ඒ තත්ත්වෙට එනතුරු ගොවීන් හොඳින් සංවිධානය වෙලා මේ වැඩේ කරයි කියලයි මගේ බලාපොරොත්තුව. මම මේ පළමුවෙනි ආරම්භය විතරයි දෙන්නේ. යම් කාලයක් යනකොට ජාතික උත්සවය වශයෙන් අපිට සිදු වෙනවා යම් උත්සවයක් සංවිධානය කරන්ට. ඒ උත්සවයෙනුත් වැඩි කොටසක් ගොවීන්ටම සංවිධානය කරන්ටය කියලා ගොවීන් ගෙන් මම ඉල්ලා සිටිනවා.

*(පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී බණ්ඩාර රත්නායක මහතා සමඟ කළ සාකච්ඡාවකිනි.)*